## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

# ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපාය මාර්ගික අධ්‍යයන ආයතනය

2006 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 2000 අංක 45 දරන ශ්‍රී ලංකා උපායා මාර්ගික අධ්‍යයන ආයතන පනත මගින් පිහිටුවන ලද ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපාය මාර්ගික අධ්‍යයන ආයතනය (LKIIRSS), විශේෂයෙන් ආරක්ෂක, ජාතික ආරක්ෂාව, නීතිය, ආර්ථික විද්‍යාව, සංස්කෘතික සබඳතා, කෘෂිකර්මාන්තය සහ පරිසරය සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනය ඇතුළුව ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික අවශ්‍යතා අධ්‍යයනය කිරීම සඳහා කැප වූ බහුවිධ පර්යේෂණ ආයතනයක් ලෙස ක්‍රියා කරයි.

ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය (LKIIRSS) එහි විධායක අධ්‍යක්ෂවරයා ලෙස සේවය කිරීම සඳහා පළපුරුදු පුද්ගලයෙකු සොයමින් සිටියි. විධායක අධ්‍යක්ෂවරයා විශිෂ්ට කළමනාකරණ කුසලතා ඇති සහ පුළුල් රාජ්‍ය, රාජ්‍යතාන්ත්‍රික සහ අධ්‍යයන ප්‍රජාවන් සමග සම්බන්ධ වීමේ හැකියාව සනාථ කළ හැකි පුද්ගලයෙකු විය යුතුය.

| | | |
|---|---|---|
| **තනතුර** | විධායක අධ්‍යක්ෂ | |
| **ස්ථානය** | කොළඹ, ශ්‍රී ලංකාව | |
| **වැටුප** | ආකර්ෂණීය තරගකාරී වැටුපක් පිරිනමනු ලැබේ. | |
| **තනතුරු ස්වභාවය** | පූර්ණ කාලීන | |
| **පැවරෙන රාජකාරි** | 1 | ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය |
| | 2 | ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ආයතනයේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ ඉදිරියට ගෙන යාම |
| | 3 | බහුවිධ පර්යේෂණ නිලධාරීන් කණ්ඩායමක් කළමනාකරණය කිරීම |
| **අවසන් දිනය** | 2025 ජූලි 7 වැනි දින ශ්‍රී ලංකා සම්මත වේලාවෙන් පැය 16.00 | |

| | |
|---|---|
| **විද්‍යුත් ලිපිනය :**<br>addl.secadmin@mfa.gov.lk | තැපැල :<br>අතිරේක ලේකම් (පරිපාලන),<br>සාමාන්‍ය පරිපාලන අංශය,<br>විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,<br>ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01,<br>ශ්‍රී ලංකාව. |

### පළපුරුද්ද සහ අධ්‍යාපනික සුදුසුකම්

**සෑම අපේක්ෂකයෙකුම :**

- ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි.
- තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා සුදුසු යහපත් ශාරීරික සහ මානසික තත්ත්වයක් සහිත විය යුතුයි.
- යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.
- ඉහළ මට්ටමේ සන්නිවේදන කුසලතා සහිත විය යුතුයි.

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

01. කළමනාකරණය, ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයනයන් පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආයතනික සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

පළමු උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක ඔප්පු කළ හැකි සේවා වාර්තාවක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතුළුව "**කළමනාකරණ මට්ටමේ**" අවම වශයෙන් අවුරුදු 20 ක සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

02. කළමනාකරණය. ජාත්‍යන්තර සබඳතා සහ උපායාමාර්ගික අධ්‍යයනයන් පිළිබඳ ආචාර්ය උපාධිය හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

**සහ**

පළමු උපධිය සම්පූර්ණ කිරීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක ඔප්පු කළ හැකි සේවා වාර්තාවක් සහ කළමනාකරණ පළපුරුද්දක් සහිත "**ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ**" අවම වශයෙන් අවුරුදු 05 ක සේවා පළපුරුද්දක් තිබීම.

**වයස**

වයස අවුරුදු 65 ට අඩු අයදුම්කරුවෙකු වීම වඩාත් යෝග්‍ය වේ.

### අමතර සටහන්

සියලුම අයදුම්කරුවන් ආවරණ ලිපියක් (cover letter) සහ ජීව දත්ත පත්‍රිකාවක් (resume) ඉදිරිපත් කළ යුතුය.

ඉහත සඳහන් කර ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට 'pdf' ආකාරයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණ වලදී එය දෘඪ පිටපත් (Hard Copy) ලෙස ඉදිරිපත් කළ යුතුය.

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පළ කර ඇත.

**ලේකම්,**
**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,**
**කොළඹ 01.**